
# 8 – පාඩම
# ප්‍රායෝගික ලේඛන



# අලුත් අවුරුද්දේ අලුත් පන්තියට
# පිය නගන ඔබට
## විශේෂ වට්ටම් සහිතව  ලාබෙට පොත්

20% ක වට්ටම්

## ඔබට අවශ්‍ය

- ★ අභ්‍යාස පොත්
- ★ පෑන් ,
- ★ පැන්සල් සහ
- ★ සියලු ලිපිද්‍රව්‍ය
- ★ නවකතා
- ★ කෙටිකතා
- ★ පරිවර්තන
- ★ ළමා කතා
- ★ බණ කතා
- ★ සිංහල ,දෙමළ ,ඉංග්‍රීසි ශබ්දකෝෂ



★ සියලු පොත්  සඳහා 20% ක වට්ටමක් සහිත ව  ඉතා පහසු මිලට ලබා ගැනීමට අදම එන්න

කෑගල්ල මහා වීදියේ,

# විජය පොත්හලට

සතියේ සෑම දිනකම පෙ .ව. 9.00 සිට ප .ව . 9.00 දක්වා ඔබ වෙනුවෙන් විවෘතයි. (පෝය දින පමණක් වසා ඇත . )

මෙම අනගි අවස්ථාව දෙසැම්බර් 01 සිට දෙසැම්බර්31 දක්වා පමණයි

විජය පොත්හල,
අංක 10 , මහා වීදිය,
කෑගල්ල.

2021 .08 .15

# ක්‍රියාකාරකම 1

සුදුසු පිළිතුර තෝරා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න .

1. එදිනෙදා ජීවිතයේදී අපට අවශ්‍ය වන විවිධ ලේඛන ………..…………………..නම් වේ .

i රාජකාරි ලිපි ii ජීවදත්ත පත්‍රිකා iii ප්‍රායෝගික ලේඛන iv ඉල්ලුම් පත්‍ර

2 . දැන්වීම් පත්‍රයක අත්‍යවශ්‍ය ලක්ෂණයක් වන්නේ ………………………….. ය .

i ලබන්නාගේ ලිපිනය ii ආශිර්වාදය iii සංක්ෂිප්ත බව iv . දැනුම් දෙන්නෙකු සඳහන් නොවීම

3. ප්‍රබල ප්‍රචාරණ උපක්‍රමයක් ලෙස …………………….. යොදා ගැනේ .

i ආකෘති පත්‍ර ii දැන්වීම් පත්‍ර iii පෞද්ගලික ලිපි iv රාජකාරි ලිපි


4 . විවිධ ආයතන සමග කටයුතු කරන්නට …............................... අවශ්‍ය වේ .

i දැන්වීම් පත්‍ර ii ආකෘති පත්‍ර iii ජීවදත්ත පත්‍රිකා iv පෞද්ගලික ලිපි

5. ආකෘති පත්‍රයක අත්‍යවශ්‍ය ලක්ෂණයක් **වන්නේ** ………………………….. ය .

i ලබන්නාගේ ලිපිනය ii අත්සන iii ආකර්ෂණීය බව iv ආශීර්වාදය

# ආකෘති පත්‍ර



බිම් සවිය මැනුම්

ප්ලෑන් පිටපත් සඳහා ඉල්ලුම් පත්‍රය

காணிப்படங்கள் பெறுவதற்குரிய விண்ணப்பம்

APPLICATION FOR PLANS

(කොළඹ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි.)

අංකය

1. ඉඩමේ නම / காணியின் பெயர் / Name of Land ……
2. ගම / கிராமம் / Village ……
3. දිස්ත්‍රික්කය / பிரிவு / District ……
4. කඩයිම් සිතියම් අංකය / கடத்திரள் வரைபட இலக்கம் : / Cadastral Map No: ……
   කලාප අංකය / தொகுதி இலக்கம்: / Block No: ……
   කැබලි අංකය / காணித்துண்டு இலக்கம்: / Lot No: ……
   බිම් ප්‍රමාණය / பரப்பு / Extent
5. මායිම් / எல்லைகள் – / Boundaries –
   - උතුරට / வடக்கு / North ……
   - දකුණට / தெற்கு / South ……
   - නැගෙනහිරට / கிழக்கு / East ……
   - බස්නාහිරට / மேற்கு / West ……
6. ඉඩමේ ඔබට ඇති අයිතිවාසිකම් සඳහන් කරන්න / காணியில் உமக்கு உள்ள உரிமை விபரம் / State your interests in the land ……
7. ඉල්ලුම්පත්‍රය එවීමට හේතුව / காணியின் படம் தேவைப்படும் காரணம் / State purpose for which application is made ……
8. නම සහ ලිපිනය (පැහැදිලිව ලියන්න) / விண்ணப்பக்காரரின் பெயரும் விலாசமும் (பெரிய எழுத்துக்களில்) / Name and Address of Applicant (in BLOCK LETTERS) ……

(* මහතා/මහත්මිය/මෙනෙවිය/ *திரு./ திருமதி/ செல்வி/ *Mr./ Mrs./ Miss

**කාර්යාල ප්‍රයෝජනය සඳහා**

ජායා පිටපත සඳහා-

ගාස්තුව:- ……

12% VAT:- ……

සතය උධෘතය සඳහා-

ගාස්තුව:- ……

12% VAT:- ……

දිනය / திகதி / *Date* ……

අයදුම්කරුගේ අත්සන / விண்ணப்பக்காரரின் கையொப்பம் / *Signature of Applicant*

* අනවශ්‍ය කොටස් කපා හරින්න *பொருத்தம் அற்றவற்றை நீக்கிவிடவும்/*Delete words inapplicable.

# ක්‍රියාකාරකම 2

පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න

1. ප්‍රායෝගික ලේඛන සඳහා සම්මත ආකෘතියක් නැත .
2. සංක්ෂිප්තභාවය දැන්වීම් පත්‍රිකාවක අත්‍යවශ්‍ය ලක්ෂණයකි .
3. කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා සඳහන්ව ඇති තැන් සම්පූර්ණ කළ යුතු ය .
4. සෑම ආකෘති පත්‍රයකට ම අවශ්‍ය ජීවදත්ත තොරතුරු සමාන නැත .
5. දැන්වීම් පත්‍රිකාවකින් පොදු ජනයා නොදන්නා කරුණු ලබාදීම අවශ්‍යය .
6. වැරදුණු තැන් තනි ඉරකින් කපා කෙටි අත්සන යෙදිය යුතු ය .
7. අයදුම් පත සම්පූර්ණ කර අවසානයේ අත්සන යෙදීම අවශ්‍ය නොවේ .
8. නියමිත තැන්වල දැන්වීම් ඇලවීම පරසර හිතකාමි වේ .
9. දැන්වීම් සකස් කිරිමට විවිධ ප්‍රමාණයේ අකුරු භාවිත කළ හැකිය .
10. දැන්වීම් පත්‍රිකාවක ට විවිධ වර්ණ භාවිත නො කළ යුතු ය .

## ❖ ක්‍රියාකාරකම 3

දැන්වීම් පත්‍රිකා ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1 . ඛනිජ තෙල් පිරිපහදුවෙන් ඉවත් කරන පෙට්‍රෝ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත ……………………. නිෂ්පාදනය කෙරේ .

2 . භූමිය දූෂණය වීම නිසා …………………. හා පස නිසරු වීම සිදු වේ .

3 . පොලිතීන් සම්පූර්ණයෙන් ම දිරාපත් වීමට වසර …………………….. කාලයක් ගත වේ .

4 . පොලිතින් මලු වෙනුවට ………………………… මලු භාවිත කළ හැකිය .

5 . අපගේ පැවැත්ම තීරණය වන්නේ …………………………සුරකුණොත් පමණි .

6 . පොලිතින් ……………… වෙසින් එන රකුසෙකි .

7 . කෑම ඇසුරුම් කිරීමට ගත හැකි ශාක පත්‍ර විශේෂයකි ……………………. කොළ .

8 . කසළ ආහාරයට ගැනීම නිසා ………………… රෝගාබාධවලට ලක් වේ .

පාංශු ජීවීන් විනාශ වීම , කෙසෙල් , පරිසරය , මිතුරු , සතුන් ,

පොලිතින් , දෙසීයක , පන්

# ක්‍රියාකාරකම 4

**ගැළපෙන කරුණු යා කරන්න**

★ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් දී තිබේ දැයි පරීක්ෂා කිරීම

★ නම ලිපිනය ලිවීමට කොටු තිබීම

★ විවිධ ප්‍රමාණයේ අකුරු භාවිත

★ සංක්ෂිප්ත බව

★ සත්‍ය නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම

★ ආකර්ෂණීය මාතෘකාවක් යෙදීම

★ තම අත් අකුරින් පිරවිය යුතු වීම

★ අදාළ නොවන තොරතුරු නොසැපයීම

★ ආකර්ෂණීය බව

★ විවිධ වර්ණ භාවිත කිරීම

දැන්වීම්

ආකෘති පත්‍ර

**ක්‍රියාකාරකම 5 -** පහත සඳහන් තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කරන්න .

## ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව - 8 ශ්‍රේණිය

1 . සම්පූර්ණ නම :- ....................................................................................................

2 . මුලකුරු සමග නම :- ....................................................................................................

3. උපන් දිනය :- අවු ; ..................... මාස .................. දින ........................

2021 . 01 . 01 වයස :- අවු ; ..................... මාස .................. දින ........................

4. ස්ත්‍රී /පුරුෂ බව :- ....................................................................................................

5 . ජන වර්ගය :- ....................................................................................................

6 . ආගම :- ....................................................................................................

7. ස්ථිර පදිංචි ලිපිනය :- ....................................................................................................

8 . ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසය :- ....................................................................................................

9. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය :- ....................................................................................................

10 . දිස්ත්‍රික්කය :- ....................................................................................................

11 . පාසලට ඇතුළත් වූ වර්ෂය :- ....................................................................................................

12 . ඇතුළත්වීමේ අංකය :- ....................................................................................................

13 . ඉගෙනුම ලබන මාධ්‍ය :- ....................................................................................................

14 . පාසලට පැමිණෙන ආකාරය :- ....................................................................................................

15 . මව /පියා /භාරකරුගේ නම :- ....................................................................................................

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි

දිනය ............................. ..............................................

අත්සන

# ප්‍රායෝගික අභ්‍යාසය

1. පාසල් හැරගිය සිසුන් සඳහා නොමිලයේ පවත්වනු ලබන පරිගණක පාඨමාලාවක් ඔබ විද්‍යාලයේදී සති අන්තයේ පැවැත්වීමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව කටයුතු සංවිධානය කර ඇත . ඒ සඳහා ප්‍රදේශයේ සිසු දරුවනබන් දැනුම්වත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකසන්න .
2. විවිධ ආකෘති පත්‍ර තුනක් සොයා ගෙන ඒවා සම්පූර්ණ කරන්න.
3. මහසෙන්පුර විවිධ බෝග වගා කටයුතුවල නිරත වන්නන් උදෙසා ගොවි සමාජයක් ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත . ගොවි පිරිස් ඒකරාශි කිරීමට එම සමාජයේ කැඳවුම්කරු ජිනදාස සූරියපති ඔබ යයි සිතා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකසන්න . ( දිනය ,වෙලාව ,ස්ථානය , ඔබ කැමති පරිදි යොදන්න .)

❖ පිළිතුරු

## ක්‍රියාකාරකම 1

1 . ප්‍රායෝගික ලේඛන

2 . සංක්ෂිප්ත බව

3 . දැන්වීම් පත්‍ර

4 . ආකෘති පත්‍ර

5. අත්සන

## ක්‍රියාකාරකම 2

1 . √

2 . √

3 . X

4 . √

5 . √

6 . √

7 . X

8 . √

9 . √

10 . X

## ක්‍රියාකාරකම 3

1 . පොලිතින්

2 . පාංශු ජීවීන් විනාශ වීම

3 . දෙසීයක

4 . පන්

5 . පරිසරය

6 . මිතුරු

7 . කෙසෙල්

8 . සතුන්

•

# ක්‍රියාකාරකම 4

**ගැළපෙන කරුණු යා කරන්න**

★ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් දී තිබේ දැයි පරීක්ෂා කිරීම

★ නම ලිපිනය ලිවීමට කොටු තිබීම

★ විවිධ ප්‍රමාණයේ අකුරු භාවිත

★ සංක්ෂිප්ත බව

★ සත්‍ය නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම

★ ආකර්ෂණීය මාතෘකාවක් යෙදීම

★ තම අත් අකුරින් පිරවිය යුතු වීම

★ අදාළ නොවන තොරතුරු නොසැපයීම

★ ආකර්ෂණීය බව

★ විවිධ වර්ණ භාවිත කිරීම

